රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: **(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** / Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/පොදු
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி: / Date: 2023.08.25

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2023.05.12 දිනැති ලිපිය හා බැදේ.

02. 2013 වර්ෂයේ සංවර්ධන නිලධාරී සේවයට බඳවා ගනු ලැබූ නිලධාරීන් පමණක් සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට උසස් වීම සඳහා අයදුම්කිරීමට යථෝක්ත ලිපියෙන් හඳුන්වා දී ඇති අයදුම්පත්‍රය භාවිත කළ හැකි බව කාරුණිකව දන්වමි. එසේම සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ 14වන ඡේදය ප්‍රකාරව සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියට හෝ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන්, සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට හා/හෝ I ශ්‍රේණියට උසස්වීම් සඳහා අයදුම්කිරීමේ දී මගේ අංක CS/DOS/අන්තර්ග්‍රහණය හා 2020.07.20 දිනැති ලිපිය මඟින් හඳුන්වා දී ඇති අයදුම්පත්‍රය පමණක් භාවිතා කළ යුතු බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

03. ඒ අනුව සංවර්ධන නිලධාරී සේවයේ ශ්‍රේණිගත උසස්වීම් සඳහා ඉල්ලුම් කිරීමේදී නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍ර පමණක් ඔබගේ නිර්දේශ සහිතව මා වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වන අතර නියමිත අයදුම්පත්‍රය මඟින් යොමු කරනු නොලබන අයදුම්පත්‍ර ආපසු හරවා එවීමට සිදුවන බවවැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

04. මේ සම්බන්ධව නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්